# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2397/69 - 2024 අගෝස්තු මස 16 වැනි සිකුරාදා - 2024.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත**

53 වන වගන්තිය යටතේ වූ නියමය

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැළකිල්ලට ගෙන අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මඟින් -

(අ) අමාත්‍ය මණ්ඩලය විසින් 2024.08.12 දිනැති අංක 24/1596/631/042 දරන තීරණය මඟින්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බලයලත් තැනැත්තාගේ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස නම් කිරීම අනුමත කර ඇති බවට;

(ආ) ඒ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස සැළකීමට හේතු මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වන බවට;

(ඇ) පනත් යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු බවට; සහ

(ඈ) නිශ්චිතව දක්වා ඇති පනත් යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මෙහි IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති දිනවල දී ආරම්භ විය යුතු බවට සහ ක්‍රියාත්මකවීම අවසන් විය යුතු බවට,

නිශ්චිතව දක්වමි.

**රනිල් වික්‍රමසිංහ,**
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2024 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

1A - PG 6829 — 312 (2024/08)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| I වන උපලේඛනය<br>ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස නම් කර ඇති ව්‍යාපාරයේ විස්තර | |
|---|---|
| 1. බලයලත් තැනැත්තාගේ නම | කළම්බු මරීනා ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් (COLOMBO MARINA DEVELOPMENT (PRIVATE) LIMITED) |
| 2. බලපත්‍ර අංකය | 2403200055 |
| 3. බලපත්‍රය නිකුත්කරන ලද දිනය | 2024 මැයි මස 03<br>බලපත්‍රය නිකුත් කරන ලද දින සිට මාස 6ක් ඇතුළත වූ දිනයක දී ව්‍යාපාරය ආරම්භ කළ යුතු ය. (2022 අංක 01 දරන බලයලත් තැනැත්තන් ලියාපදිංචි කිරීමේ, බලපත්කරණ, බලය පැවරීමේ හා සෙසු අනුමැතීන් සඳහා වූ නියෝගවල 27 වන නියෝගයට අනුව) |
| 3. අක්වෙරළ සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය | PCC00297629 |
| 4. ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර වර්ගීකරණය | ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරය |
| 5. නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් සඳහා හිමිකම | COLOMBO MARINA DEVELOPMENT (PRIVATE) LIMITED සමාගම ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස පමණක් නම් කරනු ලැබ ඇති අතර, එය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කරනු ලැබීමට සුදුසුකම් නොලබයි |
| 6. සුදුසුකම් ලැබීමේ නිර්ණායක | 2023 අගෝස්තු මස 04 වන දින අංක 2343/60 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2023 අංක 2 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල 2 (ආ) දරන නියෝගවල නිශ්චිතව දක්වා ඇති නිර්ණායක |
| 7. අදාළ වන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් යෝජනාක්‍රමය | 2023 අංක 2 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල 3 (1) (අ) වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යෝජනාක්‍රමය |

## II වන උපලේඛනය

### ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස සැළකීමට හේතු

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53(5) වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි, ජාතික යහපත සැළකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම සඳහා කොළඹ වරාය නගරය ස්ථාපිත කිරීමේ සාර්ථකත්වය සහතික කිරීම පිණිස, ව්‍යාපාරය, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස නම් කිරීමේ දී එම පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ අරමුණු සැළකිල්ලට ගනු ලැබ ඇත.

ශ්‍රී ලංකාවේ සංස්ථාපිත හා Browns Investment PLC හි පූර්ණ හිමිකාරිත්වය සහිත සමාගමක් වන COLOMBO MARINA DEVELOPMENT (PRIVATE) LIMITED සමාගම විසින්, 1-02-07, 1-02-08, 1-02-09 සහ 1-02-10 යන ඉඩම් කැබලි 4 කොළඹ වරාය නගරය බල ප්‍රදේශය ඇතුළත පිහිටි නිකේතන වරාය (Marina)සංවර්ධන ව්‍යාපෘතිය සඳහා බදු දී ඇත. 2021 දෙසැම්බර් මස සිදුකරන ලද අනාවරණයන්ට අනුව, එකී ඉඩම් කැබලි වෙනුවෙන් සිදුකරන ලද ආයෝජනය ශ්‍රී ලංකා රු. මිලියන 11,129 ක් (එ.ජ.ඩො. මිලියන 36ක්) වූ අතර සමාගම විසින් ඍජු විදේශ ආයෝජනය ලෙස තවත් එ.ජ.ඩො. මිලියන 75ක මුදලක් එහි සංවර්ධන කටයුතු සඳහා ආයෝජනය කරනු ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත ආයෝජනය ආසන්න වශයෙන් එ.ජ.ඩො. මිලියන 111ක් වේ.
මේ අනුව, COLOMBO MARINA DEVELOPMENT (PRIVATE) LIMITED විසින් නිකේතන වරාය යටිතල පහසුකම් සඳහා වන බිම් කැබලිවල අවම වශයෙන් එ.ජ.ඩො. මිලියන විසිපහක ආයෝජනයක් සිදු කරන බලයලත් තැනැත්තෙකු ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස නම් කළ යුතු බවට ප්‍රකාශ කරන්නාවූ 2023 අංක 2 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල 2 (ආ) නියෝගයෙහි තුළ දක්වා ඇති නිර්ණායක සපුරාලනු ලබයි.

යාත්‍රා 243 ක් නවතා තැබිය හැකි සහ සම්පූර්ණ ධාරිතාවයෙන් යුත් කැපිටනරි (Capitainerie) (නිකේතන වරාය පරිපාලන සහ පාලන මධ්‍යස්ථානය), අමුත්තන් සඳහා සමාජ ශාලා කාමර ඇතුළු සමාජ ශාලාවක්,ආහාර පාන ඇතුළු සිල්ලර වෙළඳසැල් සහ විනෝදාස්වාද ස්ථාන, උත්සව සඳහා අවකාශයන් සහ වාහන නැවැත්වීමේ ඉඩකඩද සහිතව නිකේතන වරාය පහසුකම් නිර්මාණය කර ඇත.මෙම අවකාශයන් මඟින් ධනවත් අමුත්තන්ගේ (affluent visitors) අවශ්‍යතා සපුරාලීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති පහසුකම් සහ සේවාවන්ගෙන් යුත් විස්තීරණ කුටි ලබාදෙනු ඇත. ඉඩම් කැබලි හතර තුළ සිදුවන සංවර්ධන කටයුතු සඳහා දළ බිම් ප්‍රමාණය වර්ග මීටර් 20,000 ක් පමණ වන ඉදිකරන ලද අවකාශයක් ඇතුළත් වනු ඇත. එමඟින් විවිධාකාරයේ විනෝදාස්වාද, සාප්පු සවාරි සහ නාගරික පහසුකම් සපයමින් ශ්‍රී ලංකාවේ සමස්ත සංචාරක අත්දැකීම සැලකිය යුතු ලෙස වැඩිදියුණු කරනු ඇත. මෙම ක්‍රමෝපායික ප්‍රවේශය සංචාරකයන් විසින් සිදු කරනු ලබන වියදම් ඉහළ නැංවීමට මඟ පාදමින් රටේ විදේශ විනිමය ඉපැයීමට තවදුරටත් දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

නිකේතන වරාය සංවර්ධන ව්‍යාපෘතිය මඟින් එහි විවිධ අදියරයන්හිදී සැලකිය යුතු රැකියා අවස්ථා ප්‍රමාණයක් නිර්මාණය කිරීමට අපේක්ෂා කරයි. මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමෙන් අනතුරුව එළැඹෙන පළමු වසර තුළ දී පුද්ගලයන් 50 දෙනෙකු පමණ සේවයේ නිරත කිරීමට සමාගම අපේක්ෂා කරයි. මෙහි කටයුතු නිම වීමෙන් අනතුරුව, දිගු කාලීන ආර්ථික වර්ධනයට දායකත්වයක් ලබා දෙමින් නිකේතන වරාය සිල්ලර වෙළඳ ව්‍යාපාර සහ සෙසු ව්‍යාපාරික කටයුතු මඟින් වැඩි වශයෙන් ස්ථිර රැකියා නිර්මාණය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**III වන උපලේඛනය**
**පනත් යටතේ ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්**

| **පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත්** | **ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්** |
|---|---|
| 1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | (අ) සියලු ආදායම්, ලාභ සහ බෙදාදෙනු ලබන ලාභාංශ පළමු විසිපස් වසරක කාල පරිච්ඡේදය සඳහා මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලුම බදුවලින් නිදහස් කරනු ලැබිය යුතු ය.<br><br>(ආ) කරන ලද සියලුම ගෙවීම් පළමු විසිපස් වසරක කාල පරිච්ඡේදය සඳහා මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.<br><br>(ඇ) පෙරකී වසර විසිපහක කාල පරිච්ඡේදය අවසන් වීමෙන් අනතුරුව, වසර දහයක කාල පරිච්ඡේදයකට මේ පනත යටතේ දක්වා ඇති දැනට ක්‍රියාත්මක ආයතනික බදු අනුපාතයෙන් 50%ක දිරිගැන්වීමක් ලබාදිය යුතුය. |
| 2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ හා සේවා ආනයන සහ දේශීය මිලදී ගැනීම් මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති බදුවලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 3. 2002 අංක 11 දරන මුදල් පනත | මෙම පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේ ය. |
| 4. 2005 අංක 5 දරන මුදල් පනත | මෙම පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේ ය. |
| 5. 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන සහ දේශීය මිලදී ගැනීම් මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 6. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ හා සේවා ආනයන මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 7. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 8. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 9. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |
| 10. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත | මෙම පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේය. |
| 11. (267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥා පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |

| **III** වන උපලේඛනය *(සම්බන්ධිතයි)*<br>**පනත් යටතේ ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්** | |
|---|---|
| **පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත්** | **ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්** |
| 12. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2022 ජුනි මස 3 වන දින අංක 2282/59 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2022 අංක 01 දරන විදේශ විනිමය (කොළඹ වරාය නගරය තුළ ආයෝජන) නියෝග හැර, මෙම පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේය. |
| 13. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |

| IV වන උපලේඛනය<br>**ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම්වල හෝ දිරිගැන්වීම්වල වලංගු කාලය** | | |
|---|---|---|
| **පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත්** | **ආරම්භ වන දිනය** | **අවසන් වන දිනය** |
| 1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | 2024 සැප්තැම්බර් 01 | 2059 අගෝස්තු 31 |
| 2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 2024 සැප්තැම්බර් 01 | 2049 අගෝස්තු 31 |
| 3. 2002 අංක 11 දරන මුදල් පනත | 2024 සැප්තැම්බර් 01 | 2049 අගෝස්තු 31 |
| 4. 2005 අංක 5 දරන මුදල් පනත | 2024 සැප්තැම්බර් 01 | 2049 අගෝස්තු 31 |
| 5. 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත | 2024 සැප්තැම්බර් 01 | 2049 අගෝස්තු 31 |
| 6. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත | 2024 සැප්තැම්බර් 01 | 2049 අගෝස්තු 31 |
| 7. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත | 2024 සැප්තැම්බර් 01 | 2049 අගෝස්තු 31 |
| 8. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | 2024 සැප්තැම්බර් 01 | 2049 අගෝස්තු 31 |
| 9. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත | අදාළ නොවේ | අදාළ නොවේ |
| 10. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත | 2024 සැප්තැම්බර් 01 | 2049 අගෝස්තු 31 |
| 11. (267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනත | අදාළ නොවේ | අදාළ නොවේ |
| 12. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2024 සැප්තැම්බර් 01 | 2049 අගෝස්තු 31 |
| 13. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත | අදාළ නොවේ | අදාළ නොවේ |

EOG 08 - 0204

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.